# ඇටිකුකුළු සඳෙශය.

කහතුඩුවේ ආණ්ඩුවේ පිරිමි පාඨශාලාවේ

මොනිටර් කෙනෙක්වූ

ඩබ්ලිව්. පී. දොන් සුවාරිස් විජය ගුණවර්ධන

වන මාවිසින් රචනාකරණලදී.

ශ්‍රීමත්

ජේ. ඩබ්ලිව්. සී. ද සොයිසා වාසල මුදලිතුමා

විසින්

සාදරයෙන් පිළිගන්නාලදී.

කොළඹ ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරණලදී.

1905.

# සංඥාපනය.

මේ සඞ්ක්‍ෂෙපය වනාංගි වයසින් ඉතාංම බාලයෙක්වූද කහතුඩු වේ ආණ්ඩුවේ පිරිමි පාඨශාලාවේ මොනිටර් තනතුරක් දරන්නාං වූද මං විසින් රචනාකරණ ලද්දුව ශ්‍රීමත් **ජේ. ඩබ්ලිව්. සි. ද සොයිසා වාසල මුදලිතුමා** වෙත ඔප්පුකොළෙමි. මෙහි මාංගේ ජන්ම භූමියවූ වැතර සිට බම්බලපිටියේ ද සොංයිසා වලව්ව දක්වාං මාගී යේ විසිතුරු සහ යවකීවාංවූ ද සොංයිසාං වාසල මූදලිතුමාංගේ ගුණවර්ණනාවද අනාගීතයි.

මෙම පොත කළාංවූ මම කහතුඩුවේ ආණ්ඩුවේ පිරිමි පාඨශා ලාවේ ප්‍රධාංන ගුරුවර ඩබ්ලිව්. ඒ. පේ‍්‍රරා මහතාංගේ ශිෂ්‍යයෙකි.

මෙම පොත ජේ. ඩබ්ලිව්. සි. ද සොයිසා වාසල මුදලිතුමා විසින් පිළිගන්නාංලද්දුව මුද්‍රනය කිරීම සඳහාං මුදල්ද මාංවෙත පරි ත්‍යාගකරණලදී.

මේ පොංත කිරීමේදී උපකාරවූ මාංමිත්‍ර කහතුඩුවේ පදිංචි පී. විලියම් දියස් මොංනිටර් උන්නැහේව මෙහිදී මතක් කිරීම මගේ යුතුකමකි.

මෙම පොංත දෙවන වාරයේදී සන්නයක් සමග මුද්‍රනය කර වමි. මෙහි අයිතිවාසිකම මටම තබාංගනිමි, මගේ **සිල්එක** නැති පොතක් යමෙක් ලගතිබී අහුවූනොංත් නීතිමාංගීයෙන් ක්‍රියාංකරමි.

මේවගට,

**ඩබ්ලිව්. පී. දොන් සුවාරිස් විජය ගුණවර්ධන**
මොංනිටර් වම්හ.

**W. P. Don Suwaris Wijiguna Wardhana**
*Monitor.*

වර්ෂ 1905 ක්වූ සැප්තැම්බර් මස
27 වෙනි දින වෑතරදීය.

---

## ශ්‍රී ම ත්

ජේ. ඩබ්ලිව්. චාර්ලස් ද සොයිසා ඇම්. ඒ. යන ගරුනාමාභිධාන

වාසල මුදලිතුමා වෙත

# ඇටිකුකුළු සඳෙශය නම්වූ මේපොත

ග්‍රන්ථකර්තෘවූ

ඩබ්ලිව්. පී. දෙන් සුවාරිස් විජය ගුණවර්ධන නම්වූ

මං විසින් අත්‍යාදර ගෞරවයෙන් ඔප්පුකරණ ලදුව

සාදරයෙන් පිළිගන්නාලදී.

# පිළිගැන්වීම.

1 මෙසිරිලක දනන්ගේ එක් මුදුන්මල් කඩක්වන්
සුරතුරක විලස්ගත් නෙක් යදින් සිත් සතොස්වං
මුදලිඳු තුම ඩබ්ලිව්. සි. ද සොයිසා බිදන් පුත්
සිරි විද විද සිත්සේ බෝකලක් ලෝ දිනේවං

2 මගෙ පෙර පිනකින්මෙන් මුන්වහන්සේ වෙතේනි
මෙම පොත පිළිගැන්විමෙන් මසිත්වූ විලස්නෙන්
නිති නෙකතුති පත්වී මේ දිවේහි නොංලස්නෙන්
මුදලිඳුතුම සිත්සේ බෝකලක් ලෝ දිනේවං

# ඇටිකුකුළු සන්දේශය.

1 සැරද මනනද නද—ඇටිකුකුළු රද සොබමින්
මහරු සිරිසැප විද—පිහුවන් මිණෙව් බැබලී

2 මසිතු නිතිසතපණ—අමවන් බසිනි මමිතුර
තුබකුස නැගී තුබ එනකල සිදඹුන න
සුබමල් කිරුළුකැටි නොගතුද ලොබිනම න

සුරගහෙහි මනනද—ලෙලසු පිපිරත් පිපුමෙව්
තොප එන සදෙහි තිදසින් හෙළර තසරෙ ක
ය න ම න සැකින් නොවැටළුවහුද දනනෙ ක

මෙවන් සිරින් බරදෙන යහ බමරු දු ල
නිතින් තොසකි දුකුමත් තුබ මුවකම ල
ස වන් අමාපුරවන වැනි ඔබ තෙපු ල
තිවන් ලබනතුරු ඇසුම්සි සැප විපු ල

3 න මං දළඹිතුරු කටයුතු පැමිණිව ර
ප මං නොවෙති සුදනෝ ගුණයුතු පව ර
මෙ මං අමා බඳුබස් කැන් ඉන් නොහැ ර
පෙ මං සුමිතුරේ දෙසවන් ලකරක ර

4 අලකාපුර සිරිසිලු - බම්බල පිවිස පුරවර
සුරතුර වැනිව සිටිනා—සී. ද සොයිසා තුමා වෙතෙහි

5 ලපටි මා තොස්නෙත්—පබද කළු හසුනේයි
කිසි දොසක් ඇති මුත්—හරිනව ක්‍රියා පුදකරනු වැදලා

6 පි ය ක රු සකිය මාසිත කුමුදුවන සෙ ට
සි න දු රු සතොස කළු සිය කුමුදු බඳුසෙ ට
තොරතුරු පසුව පවසම් හසුන රසකො ට
ම ග තු රු දූත් නිකුත්තතු අස මෙතැන් සී ව

7 ලෝ තු ර නෙක් දන පසසන නිතිමෙක ල
මං න ර පඬි දනගෙන් සැමදින උදු ල
වැ තෙ ර පිහිටි ඒ නම සැදු පොරණක ල
වැ ස ර දනු සකිසද මේනම පත ල

## මෙහි තුරුපතර ඇවෙසෙස අස

8 ස ල් සපු ඇටිඹ ගිවුළුද කෙසරු මාද ඹ
පො ල් ගුඹ පතඹ බඹරුක් නිල් මැලි කොහො ඹ
දෙ ල් සැම පනා එර හැඳිහෝ පළුකර ඹ
ත ල් දෙඹ මඩල පත්විසි ඇතුරු තුර ඹ

9 ර ත් හැ ල් සුලමාවී සැවදා බෝ ම
මො ණ ර ල් ගිරාහැල් රටවී පැසිලා ම
සැ ම ක ල් තිබෙන සිතු අලවන දුවූ සැ ම
ම න ක ල් මෙකෙත් බලමින් යතු මිතුර පෙ ම

10 සිරි පුරි මෙගම තු ර
සරණ අහනෝ පියක ර
සුරලියන් හැමව ර
නොමද පරදති රුවින් නොවිත ර

11 උප්දු සස්හිනෙ නා
ම්හිදුත් දිද්දු අන නා
වීනාමෙහි රුවැ නා
ලියන්වණනට කවිද සමනා

12 සිහිල් ජල නොම් නා
පිරිහිරි තිබෙන සොබ නා
අනෙක සිරි රඳ නා
පොකුණුදෙක බල දනන් නා

13 මෙපොකුණු දෙක ම නා
ඔළුද නෙළුම් තිබෙ නා
සිටිා සොද ලෙසි නා
මසුන්රැල බල කෙළින තොසී

14 තොපසිත ලෙස මෙ සේ
පොකුණුද බලා සතො සේ
අවුත් ඉන්නොල සේ
පිවස මුනි මැදුරනට යසසේ

15 මුනිදු සඳ දියැ සා
සුරවර කැලඳ සක සා
නැමද සිත සතො සා
බැහැර අප පාසැලට පිවි සා

16 ඇදුරු තුම දුක ලා
නාමකර මෙතොප තුමූ ලා
යන ගමන කිය ලා
පිටත්වෙව තෙරුවන් සිතෙහි

17 අ ව ර ගිරව පත්වී සිටිය දිවසු රා
අ දු ර නාසා පාසන සඳ එලිය ක රා
තිදෙ ර සැදුහැයෙන් වැද මොකැදුරු පව රා
මි තු ර තොසින් යතු සිහිකර මෙත් සුතු රා

පොල්ගස් ඕවිට නම් ග්‍රාමයට ප්‍රවිෂ්ටව අනෙකාශ්වයන් නිරීක්‍ෂණයකර.

18 තුරඟ රැලයනෙ නා
පය වැද නගින හඬි නා
සමුදුර ඝොසමෙ නා
මෙගම ගුම්ගති බොහෝ නදි නා

19 අඟන මෙහි සිරි නා
යහකල නොයෙක් සිරි නා
සුරඟන පරද නා
විලස දක්වී නුවන් අදි නා

20 නෙක සිරිනම තු රේ
දැක දැක නොලෙස මිතු රේ
කුවෙර සිත් නොංති රේ
විලිව දුවගොස් වතිය අදුරේ

21 මදස් දුර යන ක ල
තිබෙනා ඇලත් සුවිසු ල
සුරඟගෙනි පැහැදු ල
විලස දක්වී බලව සුලක ල

22 මෙලෙසින් මිතු රේ
නෙකසිරි බලා සොඳු රේ
ඉන්ගොසින් තුදු රේ
බලන් හල්පිට ඉසුරු එවරේ

23 හසුන තොප ගෙණිය න
සුර රද විලස බබල න
මැතිඳුට අසිතිව න
නොරළු උයනද බලව සතුටි

24 මෙවිලස බලමි නා
යනසඳ සිරිත දිලෙ නා
අනෙක දන සිරි නා
කෝඳුරා ගම බලව කල ණ

25 මෙසේ සිතු ලෙසි නා
විසිතුරු අනෙක තිබෙ නා
බලා ගොස් පෙම් නා
පැමිණ කැස්බෑගමට තොසී

26 බලමින් විසිතු රු
යන සඳ මදක් තුදු රු
වැව ද මන ගැඹු රු
පෙනේ දනමන නුවන් සපි

තවද සුපිපි කුමුදු කමල කල්හාරාදි කුසුම සමූහයෙන් හා හංසසේරාදීන්ගෙන් සමලංකෘතවූ මේ වැවෙහි–

27 සුවද විහිදිමෙ න
දිලෙනා නොයෙක් පාටි න
පිපුම්කැල පිරිගෙ න
බලවමමිතුර තොපසෙසිතුමෙ

28 මගුරු සහ කොර ලී
පෙටි ඉලකනසි ඉපි ලී
මෙඇවන එක ලී
කෙළින සැපිබල සකිය පිය

29 සැම දිනෙහි මනන ද
සිටින සක්වා ලිහිනි ද
දිය සැවුල් ඇද ද
බලන් නෙත්දෙක සොමාසකිස

30 වටේවම තිබෙ නා
පුවඟුද ඉළුක් සොබ නා
රඹ පේරතුරු නා
භාරඹ මිතුසඳ මෙතොප තුටි

31 මෙහි නාන තිති නා
අනෙක ඉතිරින් සොබ නා
බලා දිව අඟ නා
නොරුවටෙන් මසකිසඳලොබි

32 කොස්වැටි මුදුගෙ න
දිලෙනා තිල්වලාමෙ න
මුව පිපුම් නෙතදු න
නානලිය සකි බලන් අපමන

33 දත් දෙපෙල තුටු ව න
දිලෙනා සුදු පබළු මෙ න
දෙතොල නාදළු මෙ න
බලන් අහන් නාන කෙළිම්

34 හස පැටවුන් හර න
පියසුරු බරින් කිසවූ න
ඉහ දුනුම්ට සම න
ළියන් බලසකිවැවේ පිණන

35 මෙනි ඔවුනොවුන ති න
විතුර නානා ගැමි න
දුස සිරිතරුණන න
කවුදහපනාං වණ්ණන මුවකින

36 නෙක දනවතුන් හ ට
ලැගුමට සැදූ යසස ට
නානාසම සතු ට
මදක් නැවති බලන් මොනව

37 නැපාල්පල බාරව—සිටිනං නැනැති සත්දත්
ඩේවිඩ් මැතිතුමා—නරඹ යනු සකි සදේ තොස්නෙත්

සකලෛශ්වර්යයෙන් විරාජමානව පිළියන්දල යන අභිනව නාමාභිධාන මාම්පෙය නම් ග්‍රාමයට ප්‍රවිෂ්ටවෙව—

38 මාම්පෙය කිය නා
ගමෙහිම පිහිටි සොඳි නා
නෙක දන ගැවසෙ නා
නරඹ පිලියන්දල ද තුටිනා

39 අනෙක බිඩු වලි නා
පූරවා තිබෙන නොමි නා
සල්පිල් සිරිම නා
නැඹ එහි සිට මදක් තොසි

40 තිතින මෙහි තොසි නා
තම තම රැකෙන සිති නා
වනික් කම්කර නා
බලායව තොප විහාළයි නා

41 පි ලි ය න් දලින් තුඹ ගොස් සකි කඩිනමෙ න
දූ වූ ව න් පිණන කොත්වත් තිබෙන අපම න
ඉ සුරෙ න් යුතුව සිටිනා දන නැත ගණ න
මහමෙ න් මතුර ඇම්බෝවිල බල කල ණ

42 ම හ හ ර රුසිරු අඟනන් දැක නිති සර ණ
ම ග තු ර සිටින තරුණන් උන්වෙත ලොබි න
මි තු ව ර නරඹවින් නෙත්සිත් පිණවමි න
සි ත පු ර යතුරු කර තුම්බෝවිල ගමෙ න

43 නොවිතර සරුකොත්වත් පිරෙමින් තිබෙ න
පු ර ද ර විලස පළකළ ඉසුරෙන් නොමි න
ග රු ත ර නොතාරිස් මැතිසඳ ගුණ නද න
ම මි තු ර බලන් බෝකුන්දර ගම විස න

44 සොබමන් කුසුම් තැන තැන දිසි අපම න ය
සි ත ස න් තොසින් නරඹාමන පිණ පි න ය
ම ම දු න් හසුන සිතමින් ගරුකර මි න ය
කඩි න න් කරන් සකි සිඟිකර බුදු ගු න ය

45 සු ග ති දු බස විලස පවතින සියළු දි න
ම න බ දු ගුණැති සුදනන් සෙවන අපම න
ම ස බ දු සදිනි කවුවලනම් පෙදෙසයෙ න
ම ද කු දු නොසිට පලයන් කඩිනන් වෙම් න

46 හෙ ක සි රි නා  ඇති කෙත්වත් අපව  නා ය
තො ප තොං සි නා  නෙත්දෙක හැර බලමි  නා ය
ම නා න ද නා  බොරළැස්ගම ට පැමි  නා ය
න ව නි මි නා  සිඟිකර නයන ගම  නා ය

47 එහි සිරි බලංලාං—පැමිණ වනගත පෙදෙසට
අනෙකතුරු ඇ තොස්නෙත්-බලවත් සද නොවිකලබල

යළිත් වනගත වැණුම් අස-

48 විදුරු මලගිය උමතු බිජු පුර පනස අත්ද  ර
දුම්දු සතපත් සතරගුල් එරබදුද සමද  ර
සමග කුවෙරළස් හුනගකලි දුම්නාං වැසිනා ව  ර
මෙලෙස මේතුරු නරඹින් යව සබඳ සිතඳු  ර

49 මිහුරු වියලු වේරුපු සලලසා  මු ව
එකග කලද කැනගිල් මැදිරි විලි  මු ව
සලල සරභ පිරපු බොහොඩන කු  මු ව
උකුසු සියොත් නඹසිඑහලල සිලි  මු ව

50 මෙලෙස බලා  පසු කරමින් වනපෙදෙ  ස
තොංප නුමුලාං  ගොස් බෙල්ලන්විලට තොං  ස
නොව කුහුලා  මුනි මැදුරට එහ පිව්  ස
වැ ද වැ ටි ලා  බල විසිතුරු නතුවිල  ස

51 නැගිට සෙමි සිට තොප—පිටව මුනි මැදුරෙනිනා
බුදුන් වඳිනට යන—දනන් නරඹන් පසෙක සිටගෙණ

52 කාබී සැනසෙමින්—මද කලක් සැතපී හිද
පිටවී නොලෙස මිතුවර—පිවිස නිකාය නාම් පෙදෙසට

53 සුනතිඳු වදන නරලෙස නිති අදනාමි  න
ගුණනැන ඉසුරුමත් දන වසන අපම  න
පුරදර බවන වලසින් දිලෙන සැමදි  න
මිතුවර බලව මෙහි ඇති මැදුරු සතොංසි  න

54 නි ක පෙ බ ලාං  ගොස් සකි නුබ වහ නුබි  න
සතොං ස වෙ ලාං  කරගම්පිටියට පැමි  න
නො ව ම මු ලාං  දෙව්ලොවයයි දැක සද  න
ලෙං බ දු ර ලාං  නරඹනු සකි සිත්ලෙසි  න

55 මැ න ක ප ට න්  සිරියෙන් නිති දිලුනුවෙ  න
බෝ ල තු ම න්  කරවූ තුනුපා පෙළ  න
නේ ල ක රි න්  පුත් එක වෙසහර උදින්  න
බෝ ස තො සි න්  නරඹා යනු කාඩින මෙ  න

56 නෙතසිරි පිරි සුරපුර පරදන ලෙසි නා
සුර වර බඳුනෙක මැනිවරු නිති දිලෙ නා
මන හර රුචිත දිසි අඟනන් නිති සර ණා
සිත පුර පැමිණ දෙගිවල බල මිතු කල ණා

57 මෙනි යනෙන දුම්රිය—දකිමින් නොගෙණ කිසිබය
තුබින් ගොස් මිතුවර සඳ—පැමිණ සිරිදුරු වැල්ලවත්තට

58 හුනු නිත නේ සාදන දන නැත ගණ නා
කුනු ග දි නේ යත්නව බැරිය සැමදි නා
මනු සි ති නේ කඩනත් කරමින් සොඳි නා
යනු ස කි නේ බම්බලපිටියට මෙදි නා

59 ලෙංවකින් පතල මහ දනවත් මැතින් දි සී
අපමණ පිනැති උතුමන් ගැවසෙන යස සී
හැමසඳ සිරිනි සත්පුරුෂන් මේ පෙදෙ සී
මිතුවර නෙතැර බලමින් යව නොව අල සී

සබඳ අප මිතු මහාධනෛශ්වර සොයිසා මන්ත්‍රීශ්වරයෝ වාසය කරන්නාවූ මේ බම්බලපිටි පුරප්‍රවරයෙහි වණිනා විශෙෂයක් තා ශ්‍රවණයකර–

60 ස තොං සා විපුල සිරිසරයෙනි දිලි විත ර
මනදෙ සා පතල සුනිමල කිත් රැසක් ද ර
ස දි සා මුළු ලොවට තිලිණයෙනි සුරතු ර
සො සි සා මුදලි මැතිසඳ දින දින මෙපු ර

61 සු ල ක ල සොඳුරු හෙල පැහැයෙන් නිති දිලෙ නා
නි ම ක ල නොහැකි සිරිසරයෙන් මනනද නා
දු ටු ද න මන නුවන්කලඹන එහි තිබෙ නා
ස කි ස ද බලන් පනපෙල ඇවිද තැන තැ නා

62 සැ ම කා ල් විසල් පහවල් වලෙහි වැජඹෙ නා
ම න කා ල් පිය තෙපුල් පවසන ගුණ නද නා
ඇ ම කා ල් විසල් දනයෙන් හෙබි සිත ලෙසි නා
සි ත ලොල් ලකල් දනයින් බල තොප තොසි නා

63 ප හ ව ල නිතින සිටිනා සිත්සේ බෝ ම
රු ව දු ල පැලඳි නෙක අබරණ මනරු ම
බ ල බ ල සිටින මහ මග යන එන සැ ම
සි ත ලො ල නොම බලන් අබිසරු ලයපේ ම

64 ය සි න් නන් සි ටි න් න න් හොමින් නන් දකි න්නේ
රු චි න් නන් සු රි න් ද න් ලෙ සි න් නන් ගැනෙ න්නේ
මෙව ය් දු න් නුව න් ව න් ලෙ ව න් කු ම් කිය න්නේ
රු චි න් නන් මෙවැන් නන් ලෙ ව න් නන් නැති න්නේ

65 බ සි න් න න් මෙවැ න් නන් කියන් න න් තොසි න්නේ
හ ඩි න් න න් නොම්න් නන් නිරන් නන් මේදූ න්නේ
ය සි න් න න් ඔ ම න් න න් බිඟුන්මෙන් සිතෙ න්නේ
මෙවැන්න න් සොඳින් නන් සු ර න් ද න් එව න්නේ

66 මෙහි යනෙන මනහ ර
දිලිහෙල රුචින් නොවින ර
තුරග රැල වර න ර
බලව තොපසින් ලෙසින් මිතුව ර

67 තුරඟ රැල යන ක ල
පය වැදනා ගින කොලහ ල
පුර සැමතැන වත ල
ඇසේ සමුදුර ගොසෙව් මේක ල

68 අසුරැලගෙ පයවැ ද
නාගිනා දූලි නොවිහි ද
නුබම්හ වසා සෙ ද
සෙවනාකර සිටි මෙපුර හැමස ද

මහාබනේශ්වර වාසල මුදලිමන්ත්‍රීශ්වර ජ්‍රෝනිස් විලිඅම් චාර් ලස්ද සොයිසා ධර්මගුණවර්ධන විපුලජයසූරිය කරුණාරත්න දිසා නායක ශ්‍රී රාජගතානුභෙශ කුරුකුලශෙඛර සමාදෘන විතිශ්වය කාරොත්තමයාණන් ගේ කීර්තිවර්ණනාවක් නා ශ්‍රවණයකර-

69 ලකඟනගෙ හිසමත—එක් මුදුන්මල්කඩක් වන්
සිරිසරින් සුපිහිටි—බම්බලපිටිය පුරවරේහී

70 පැ න නැ ගු නා මෙම්තිස් ලෙංව සුරතුර ර ය
දෙ න ද නී නා දින දින නොමැති අන ර ය
ය ස ලෙ සි නා වැඩ ඉඳිනා පෙම්බ ර ය
අ ප පි නි නා ලැබූ සොයිසා සුරව ර ය

71 සි හැන්රි නම් නා
සොයිසා මුදලි සොඳි නා
නෙකා සිරි විඳම් නා
ගියේ සුරපුර බලේ පෙන් නා

72 මුදලිඳු නැති බැවි න
දෙමුපුත් තුමා සසොබ න
තව සොඳ පිය ලෙසි න
රකිතුම සොහොයුරන් සැමදින

73 රුසිරෙන් ම රාවන්
නැනයෙන් සුරගු රාවන්
තෙදින් මිතු රාවන්
සොයිස කුලඹර සසඳ රාවන්

74 සුරතුර සුරබිඳෙ න
පැරදි තිළිණෙන් සැමදි න
අප මුදලිතුම ගු න
මදක් පවසමි අසවතොසය

75 ජේ. ඩබ්ලිව්. ම නා
චාර්ලස් සොයිස නම් නා
මැතිතුමගෙ සොබ නා
නොගුණ වණනට කවිද හප

76 තමගෙ සොහොයුරු කැ ල
මොනවට බලා ඇති ක ල
අප මැතිව නැත බ ල
සරිකෙනෙක් වෙතඇද්දමිහිත

77 ගුණිනැනෙති මනතු ව
සොඳ ලෙස සිටින සැමව් ව
සොහොයුරි යුවලක ව
උගන්වා සිප්සතර කදිම ව

78 මේමැතිගෙ කිතුගොං ස
දසදෙස ඇසෙයි යස ලෙ ස
මෙවැනි ගුණ නැත ය ස
ඇතිකෙනෙක්තොපදුටුදදියකු

79 සැම දනගෙ වැඩගැ න
වියදම්කළෙ නොමින්ද න
අප මැතිව සමව න
කෙනෙක් මිහිපිට ඇද්දඅන්තැ

80 බඟකලේ නිව සේ
වසනා තොසින් සක සේ
අප මුදලි සිත සේ
සැදුව නෙක වැඩ බලා මෙදෙ සේ

81 ප බ ද මෙමැති සඳ ගුණ කණ ලොප ස ත ය
නොමද නිවට සුරගුරු දෙවි රදන ත ය
ප සි ද මදක් වණනට නම් වත් වෙ ත ය
මෙස ද කෙනෙකු සැබවින් නැත මිහිම ත ය

82 ගු නේ සිතැති සොයිසා මුදලිඳු පා ය
පෙනේ පෙරදෙසෙහි නොකා සිරි දුරු පා ය
සෙනේ සිතින් නැඹා ඉසුරැති පා ය
අ නේ පිවිස සුපිණිපි උයනට පා ය

මහා ධනෙශ්වර මේ මන්ත්‍රීශ්වරයෝ කෘත්‍ය බාහුල්‍ය බැවින් කොළොම්පුර තම ලිපිසැලට ගොස් සිටි. එනිසා

83 එනතුරු මැතිවර—කසගසක් තුර ගිදනෙණ
නොකැරවීතු කොලහල—තොසින් විසිතුරු සෙමින් නරඹා

84 රුක මුදුන සුලක ල
සිටිනා සඳෙහි නොපැකී ල
පැල දෙසෙහි මනක ල
ඇසේ සමුදුර ගොසඳ සුවිසු ල

85 සමුදුරෙහි සැම වි ට
යනෙනා නොමින් මනතුට
නෙක දනවතුන් හ ට
අයිති නැව් තටපෙනෙසිමොන

86 බොහො තිබෙනා සිරිස ර
උතුරු යනෙයි සැකක ර
සිතා අප මැතිව ර
කරවූ පවුරක් බලව මිතුව ර

87 මේ පවුර මනහ ර
සැමදින රුවින් දිසිව ර
මොනවට එළුව යු ර
අනත දරණිය වැතිය සැමව

88 මුදලිඳුගෙ නිති නාං
වාසල තුලෙහි සිටි නා
නෙක දන යන එ නාං
දෙරවූවක් බල ඉතා තුටි නා

89 දොරටුවෙහි සොබ නාං
නෙත් සිත් පිණනා නිති නාං
තිබෙන නෙක රුවි නා
විදුලි පහණද බලව තුටි නා

90 උයන මැද පෙදෙ සේ
තිබෙනා රුවින් සොඳ සේ
අප මුදලි සිත සේ
කෙරෙව් ජලපියුම බලයසසේ

91 මිදුල මැද පෙදෙ සේ
තිබෙනා නිතින් සක සේ
මල්වත්ත සිත සේ
බලව මිතුවර බොහෝසොඳ

92 මැතිඳුගෙන් පැනස ර
පිහිට ලැබුමට මනහ ර
ඇවිත් තම සිතඳු ර
සිටින දුගිකැල බලව මිතුවර

93 නමදමින් සැමදෙ න
ඉත්නාං සදෙහි සතුටි න
පිළිබිඹු යන සිතී න
නොරුවටෙව දුගිදනන් බලමි

94 මැතිඳුගේ අස් රැ ල
යනෙනා සදෙහි නොපැකිල
තොපසිත ලෙස මෙක ල
බැංබය නොව මිතුර මනක

95 මැතිඳුට සරිව නාං
උතුමෙක් නැතෙයි මෙදි නා
මැතිතුම ද යසී නාං
බලව තොපසිත් ලෙසින් කල ණා

96 සොයිසා මැති වියැත—පහල සොඳ දිවපුරුවන්
සි රි ලක තිබෙන දනවත් සරු කෙනෙව් දි සි
සි රි සොඳ පිහිටි බිජුවක්වන් මැති ස දි සි

සි. හැන්රි නම් පුත්—සොයිසා මුදලි දෙටු පුත්
නෙක රට සොඳව කිතුගොස පලවී තිබෙ න
මෙ ලකට එකම සඳවැනි මේ මැති තුම න

කො ළ ඹ කොටුවෙ සිට අව්දින් ගිමන හැ ර
එ ළ ඹ මැදුර වෙත සිද ගෙණ සිත් අදු ර
පො ළ ඹ වමින් වැඩකරුවන් සිටින ව ර
න ර ඹ තොසින් පදනමකර මැති පවු ර

97 එවිට ඒ මැතිව ර
තොපගෙන් යමක් ඇසූව ර
ආ කරුණු සැලක ර
තොසින්ලහසිට කියමෙපුවතර

98 කහතුඩුවෙ පාසැ ල
සිසු ගුරුකෙනෙක් ගුණ දූල
මා සමග බෝක ල
මිතුරුකම් බැඳ සිටිසිතුලොල

99 ඒ තුමා මනහ ර
තිති ඔබ වෙතෙහි පෙමකර
මා වැඩට නිමක ර
එව්ව බව දැනගනුව මැතිවර

100 මැති සඳුනි එනි සා
මා මේ කියන බස සා
මෙහසුන සොඳ ලෙ සා
මෙහෙහි කලමැන මෙතිනි සක

101 ඒතුමං සැම දි න
ඔබ සහ මිතුරු වන මෙ න
ඉඳින බව සතුටි න
කියන්නට මා එව්වෙ මෙලෙසින

102 පවර මුදලිඳු නි
හසුන දන්වන ලෙසි නි
ආවෙ මම් තොසි නි
එබව දැනගණුමැනවකියමි

103 තොංප එන්නට යසි න
සැරසෙන කාලට විගසි න
මුදලිඳුගෙ මව් ව න
ලේඩිසොයිසාමැතිනි සතොසි

104 මන්දිරේ ඇතු ලේ
සිටලා තොසින් උඩු ලේ
තොප දැක මෙම ක ලේ
එන්ට සැරසෙනමැතිතිලක

105 සිරිලක ලියන්ගේ—එකම කිරුළක් හරණ
නෙක සිරිදණ සොයිසා මැතිනි පිය බ ස
තුබ දැක අවුත් උන්සඳ පුටුව පිට තොං ස

නෙක තුති පවත්වා—නරඹා මැතිනි සතොංසින්
ර ස ව ත් හසුන සැලකරමින් මනා කොං ව
අ ම යු ත් වදන් පිලිතුරු තොංප ලබාං තු ව

පි න් සි රි නා තිති බබලන මැතිනි ය ස
සි ත් ලෙසිනා දූත් පිලිතුරු ගෙණ සක ස
මෙත් සිතිනා ආවඩමින් ඉනාව අල ස
මිත් තු ම නා නෙක සිරි ලැබ මගට බැ ස

106 පැමිණ අප පෙදෙසට—මාවෙත අවුත් නොංවලස
සිදුවූ කාරුණු පවසා—පිවිස තොප සියොංතුරට මනනද

107 බෝබල දරණ සොයිසා මුදලිඳුම ය සේ
මාදූන් හසුන සැලකර මනහර විල සේ
නෑසිය සමග සිරිවද තොප මෙදිය කු සේ
බෝකල් පවතු තුනු තඹරද සිත විල සේ

108 ගොවිකුල  උපන් රැඳි වැතර නම් පිය  ස
නැන බල  උපත් හෙළු සකු මගද පරබ  ස
ම න කල  දෙන් සුවාමිස් මොනිටර් මෙලෙ  ස
කවි කල  බැවි දතපුතු තුනු තඹ සඳෙ  ස

109 මෙහි මද පමං ඇ—යම්කිසි දෙසක් ඇති මුත්
පඬිවරුනි නොවඩා රෙස්—මෙත් ජලෙන් හරිව් සෝද,

110 කිවිමන් සුකවි කැල—ගරහත යලිදු පසසත
කම් කිම් මෙමා කළ තැන—පඬුවෝ මවෙනි පමණෝ

111 සි ර ස  කියඹු බැමඟහනය කරදෙ ඇ  සා
අ ද ර  පබළු නද බඳ පපු දෙදන හි  සා
උ ද ර  පෙකනි ලිගු පාරුස දද තුනු  සා
සි රු ර  පතුල් පදසං ඇ සැම නොලෙ  සං

112 දිනිඳු අටකර අනත දිවපුරු ලබොද  රා
උවිඳු දද රද රතග සිසිපුත් සුරගු  රා
සමග සැමදෙවි මෙඅප සහ අප මැතිව  රා
රකිනු කව්දෙස් දුරුර සැපදී ලෝතු  රා

113 පු ත්  එක දහස විසිසත්වෙනි මෙසකව  ස
ප ත්  සඳ නල රුසව දිනරද ඇසල ම  ස
ද ත්  ලෙස පබඳ කළ මේ තුනු තඹ සඳෙ  ස
මෙ ත්  කර බලනු සැම සුදනෙනි මවම්නි තො  ස

—( නිමි. )—